(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 10.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 ජුනි මස 26 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0063/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගුවන් යානා සහ නැව්වලට ශ්‍රී ලංකාවේ ලියාපදිංචිවීමට 2008.01.01 දින සිට ක්‍රියාත්මක වූ අය-වැය ලේඛනයෙන් සහන සලසා තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දින දක්වා ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම සහන සැළසීමෙන් අනතුරුව එලෙස ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සහන සැළසීම නිසා අහිමිවූ ආදායම් ප්‍රමාණය කොපමණද;

(iv) එලෙස වෙනත් රටක පහසුකම් මත ලියාපදිංචිවීමේ සහනය ලබාදීම තුළින් අප ලබාගත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම සහන ලබාදීමෙන් අනතුරුව ලියාපදිංචි කරන ලද නැව් සහ ගුවන්යානා හිමිකරුවන්ගේ සහ කොටස්කරුවන්ගේ නම් කවරේද;

(ii) මෙහිදී ලබාගත් ප්‍රගතියේ මට්ටමට වඩා වැඩියෙන් පුද්ගලයන් ආකර්ෂණය කරගැනීමට නොහැකිවූයේ මන්ද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0206/'09

2.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සුනාමියෙන් දෙමාපියන් හෝ භාරකරුවන් අහිමි වී ඇති දරුවන්ගේ වියදම් දැරීම සඳහා විශේෂ අරමුදලක් පිහිටුවන බවට "මහින්ද චින්තනයේ" සඳහන් වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විශේෂ අරමුදල පිහිටුවනු ලැබුවේ නම් ඒ කවදාද;

(ii) එම අරමුදලෙන් සහන ලබාදී ඇති දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම විශේෂ අරමුදලෙන් සහන ලබා දී තිබෙන දරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0256/'09

3.

ගරු අජිත් කුමාර මහතා, — අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක රජයේ පාසල්, පිරිවෙන් හා පෞද්ගලික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් ඒවා නම් වශයෙන් කවරේද;

(iii) ඉහත රජයේ පාසල් හා පිරිවෙන් සඳහා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව හා දැනට සිටින ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ රජයේ පාසල් හා පිරිවෙන් අතුරින් මේ වන විට වසා දමා ඇති සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් කොපමණද;

(ii) එම පාසල් හා පිරිවෙන් වසා දමන ලද්දේ කවර වර්ෂවලදී ද;

(iii) ඒවා එලෙස වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) කවර හෝ හේතුවක් නිසා වසා දැමීමට නියමිත වූ පාසල් හා පිරිවෙන් වසා දැමීමෙන් වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේනම් එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0384/'09

4.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය ජනාධිපතිවරණය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද "මහින්ද චින්තනය" හෙවත් මැතිවරණ ප්‍රකාශනයේ, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම කර්මාන්ත ශාලාවක් විවෘතකර රැකියා 500ක් ලබාදීමට කටයුතු කරන බවට සඳහන් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) විවෘතකර ඇති එවැනි කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්ත ශාලා විවෘත කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) ලබාදී ඇති රැකියා අවස්ථා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0064/'09

5.

ගරු රවි කරුණානායක මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලුණු නිපදවන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ පිහිටීම සහ නිෂ්පාදන ධාරිතාව කොපමණද;

(iii) මෙකී සමාගම්වල හිමිකරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර 20ක කාලය තුළ ශ්‍රී ලංකාවේ ලූණු ඉල්ලුම වාර්ෂික පදනමින් කොපමණද;

(ii) පසුගිය වසර 10ක කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සමස්ත ලූණු ප්‍රමාණය කොපමණද;

(iii) පසුගිය වසර 5ක කාලය තුළ ඉහත සඳහන් ආනයනයන්හි වටිනාකම රුපියල් වලින් කොපමණද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0207/'09

6.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 අයවැයෙන් ධීවර ජනතාවට සහන ලබා දී තිබේද;

(ii) එම සහන කවරේද;

(iii) එම සහන ක්‍රියාත්මක වන්නේ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0257/'09

7.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාසල් සිසුන් සඳහා ඉංග්‍රීසි, දෙමළ හා ජපන් භාෂා ඉගැන්වීමට "ග්‍රාමීය අධ්‍යාපන සංවර්ධන ඇකඩමිය" නම් වූ ආයතනයක් දකුණු පළාත ඇතුළු පළාත් ගණනාවක ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත පාසල් කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අනෙකුත් පළාත් සහ අදාළ පාසල් කවරේද;

(iii) ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලින් එම ආයතනයට අනුමතිය දී තිබේද;

(iv) ඒ කවර දිනයන්හි දී කවුරුන් විසින් කවර කොන්දේසි යටතේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ සිසුන්ගෙන් මුදල් අයකරන්නේ නම්, එක් සිසුවෙකුගෙන් අයකරන මුදල කොපමණද;

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය හෝ රජයේ වෙනත් ආයතනයක් විසින් ඊට අනුමතිය ලබාදී තිබේද;

(iii) එම ව්‍යාපෘතියට ගුරුවරුන් බඳවා ගැනීමට අදාළ ආයතනය අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

(iv) එම ගුරුවරුන් ඉංග්‍රීසි, දෙමළ හෝ ජපන් ආදී භාෂා ඉගැන්වීමට සුදුසු අය බවට සහතිකයක් තිබේද;

(v) අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ රජයේ වෙනත් යම් ආයතනයක් මගින් මෙම ව්‍යාපෘතිය අධීක්ෂණය කරන්නේද;

(vi) එසේ නම්, ඒ කවුරුන් විසින්ද;

(vii) අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතියක් ලබා හෝ නොලබා තිබියදී, අදාළ කොන්දේසි අනුව කටයුතු කර නැත්නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0208/'09

8.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ කොපමණ වැව් හා ජලාශ ප්‍රමාණයක මත්ස්‍ය වගා කටයුතු ආරම්භකර තිබේද;

(ii) ඒ කවර වැව් හා ජලාශවලද;

(iii) ඒවායේ වගා කළ මසුන් වර්ග කවරේද;

(iv) එම වැව් හා ජලාශවල මත්ස්‍ය වගාවේ නිෂ්පාදනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0258/'09

9.

ගරු අජිත් කුමාර මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමි ව්‍යසනයෙන් පසුව ගාල්ල මහමෝදර රෝහලට විකල්ප රෝහලක් ලෙස කරාපිටිය රෝහල ආසන්නයේ රෝහලක් ඉදිකිරීමට පියවර ගනු ලැබුවේද;

(ii) එසේ නම්, එම රෝහලට මුල්ගල තබන ලද්දේ කවදාද;

(iii) එම රෝහල සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදෙන්නේ කවර රටක, කවර ආයතනයක, කවර පුද්ගලයෙක්ද;

(iv) එම මුදල් ප්‍රමාණය කොපමණද;

(v) ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන ණයක්ද නොඑසේ නම්, ආධාරයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම රෝහලේ මුල් සැලැස්මේ මහල් සංඛ්‍යාව සහ අන්තර්ගත පහසුකම් කවරේද;

(ii) එම සැලැස්ම පසුව සංශෝධනය වූයේ නම්, එම සංශෝධනයට අනුව මහල් සංඛ්‍යාව හා අන්තර්ගත පහසුකම් කවරේද;

(iii) එම රෝහල සඳහා දැනට ලැබී ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) දැනට ඉදිකිරීම් තත්වය කවර මට්ටමක පවතීද;

(v) මෙම රෝහලේ ඉදිකිරීම් සමාගම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 149— වැඩසටහන 2,— † 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දෙසීයයකට (රු. 200,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 149 | — | කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන | |
| | | | මූලධන වියදම් | රු. 200,000,000 |
| | | | | රු. 200,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ජූනි මස 12 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 3 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සහ 2 එකතුව රුපියල් 2,749,830,000.

*2.

ප්‍රවාහන අමාත්‍යතුමා— පරිපූරක මුදල — ශීර්ෂය 114— වැඩසටහන 2,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් දශ ලක්ෂ දෙදහස් දෙසීය අනූනමයයි දශම අටයි තුනකට (රු.ද.ල. 2,299.83) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 114 | — | ප්‍රවාහන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන කටයුතු | |
| | | | පුනරාවර්තන වියදම් | රු.ද.ල. 2,299.83 |
| | | | | රු.ද.ල. 2,299.83 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ජූනි මස 12 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 450,000,000.

*3.

සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*11.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*12.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*14.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04)[1]

*18.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*20.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*24.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*25.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

26.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

27.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

28.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

29.

පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

30.

ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0247/'09

1.

ගරු අජිත් කුමාර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල්ගේ අංක 10/10/2525/2004 (05) හා 2005.09.30 දිනැති ලිපියෙන් ඒකාබද්ධ තැපැල් සේවයේ "අ" කාණ්ඩයේ III ශ්‍රේණියේ "අ" ඛණ්ඩයේ තනතුරුවලට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා 2005.10.12 සිට 2005.10.14 දින දක්වා තැපැල් මූලස්ථානයට කැඳවන ලද ඒකාබද්ධ තැපැල් සේවයේ "අ" කාණ්ඩයේ III ශ්‍රේණියේ "ආ" ඛණ්ඩයේ ප්‍රධාන තැපැල් ස්ථානාධිපති, පාලන සහකාර, තැපැල් කාර්යාල විමර්ශන පරීක්ෂක හා තැපැල් කාර්යාල ගිණුම් පරීක්ෂකවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන්ගේ නම්, තනතුරු හා රාජකාරී ලිපිනයන් කවරේද;

(ii) ඉහත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අය අතුරින් 2007.07.31 වැනි දිනට ඒකාබද්ධ තැපැල් සේවයේ "අ" කාණ්ඩයේ III ශ්‍රේණියේ "අ" ඛණ්ඩයට උසස්වීම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම නිලධාරීන්ගේ නම්, තනතුරු, උසස්වීම් ප්‍රදානය කළ දිනයන් හා රාජකාරී ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0249/’09

2.

ගරු අජිත් කුමාර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල්ගේ අංක 10/10/අIIIඅ/03/06 හා 2006.02.27 දිනැති ලිපියෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමතියට යටත්ව, තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමතිය මත, 2006.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකාබද්ධ තැපැල් සේවයේ “අ” කාණ්ඩයේ III ශ්‍රේණියේ “අ” ඛණ්ඩයේ පුරප්පාඩු තනතුරුවල පූර්ණකාලීනව වැඩ බැලීමට පත්කළ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන්ගේ නම්, තනතුරු හා රාජකාරි ලිපිනයන් කවරේද;

(ii) ඉහත නිලධාරීන්ගෙන් 2007.03.31 වැනි දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම ගන්වා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම්, පුද්ගලික ලිපිනයන් හා විශ්‍රාම ගන්නා විට දැරූ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉහත (අ) අනුව, පූර්ණකාලීනව වැඩ බැලීමට පත්කළ පුත්තලම, බදුල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය තැපැල් අධිකාරිවරුන් ලෙස රාජකාරී කළ ජී. ගොඩගේ, කේ. ජී. ගමගේ සහ ආර්. ඒ. කොට්ටහච්චි යන මහත්වරුන් පිළිවෙලින් 2006.08.22, 2006.12.21 සහ 2007.02.09 දිනයන්හි වයස අවුරුදු 60 සම්පූර්ණවීම නිසා විශ්‍රාම ගැන්වූ හෙයින් දශක හතරකට නොඅඩු සේවා කාලයක් ඇති මෙම නිලධාරීන් තිදෙනාගේ වැඩ බලන තනතුරු ස්ථිර කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?